# පිස්කල් විකිණීම් පිළිබඳ දැන්වීම්

## ගල්කිස්ස දිසා අධිකරණයේ දී ය

ග්ලෝබුස් ප්‍රොපර්ටි ඩිවලොපර්ස් (පුද්ගලික) සමාගම,
අංක 18, පී. ටී. ද සිල්වා මාවත,
දෙහිවල.

................................................................................ පැමිණිලිකරු.

නඩු අංකය :
2265/06/එල්.
ඇස්කීසි අංකය :

එදිරිව

1. ඩබ්. සේනාරත්න
2. දිනේෂ් සේනාරත්න
දෙදෙනාට 18ඒ, පී. ටී. ද සිල්වා මාවත,
දෙහිවල.

................................................................................ විත්තිකරුවන්.

ඉහත අංක දරන නඩුවේ 2010.02.22 දිනැති තීන්දු ප්‍රකාශය ප්‍රකාර පැමිණිලිකාර සමාගම විසින් විත්තිකරුවන්ට ගෙවිය යුතු රු. 65,00,000 (ලක්ෂ හැට පහක්) මුදලක් ද එකී මුදල සඳහා එම මුදල ගෙවා අවසන් වන දින තෙක් නෛතික පොලිය ද තක්සේරු නඩු ගාස්තු ද, ගෙවීමට පැමිණිලිකාර සමාගම අපොහොසත් වී ඇති බැවින් එකී මුදල අය කර ගැනීම සඳහා මා වෙත නිකුත් කර ඇති දේපල තහනමට ගැනීමේ ඇස්කීසි බලපත්‍රයේ බලය පිට මවිසින් වර්ෂ 2012.08.29 තහනමට ගන්නා ලද එකී පැමිණිලිකාර සමාගමට අයත් පහත උපලේඛනයේ සඳහන් දේපල එම දේපල පිහිටි, දෙහිවල, පී. ටී. ද සිල්වා මාවත වරිපනම් අංක 18 "කල්දේරාගේ වත්ත" නැමැති ඉඩම පිහිටි ස්ථානයේ දී ම වර්ෂ 2012 නොවැම්බර් මස 21 වැනි දින ප. ව. 2.00 ට මවිසින් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලබන බව මෙයින් දැනුම් දෙනු ලැබේ.

උපලේඛනය

බස්නාහිර පළාතේ කොළඹ දිස්ත්‍රික්කයේ සල්පිටි කෝරලේ පල්ලේ පත්තුවේ දෙහිවල ගල්කිස්ස මහ නගර සභා සීමාව තුල දෙහිවල පිහිටි දැනට පී. ටී. ද සිල්වා මාවත වරිපනම් අංක 18 දරන ස්ථානයේ පිහිටි කල්දේරාගේ වත්ත නැමති ඉඩම දෙහිවල ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ අංක 60/37 යටතේ ලියාපදිංචි කරන ලද බලයලත් මිනින්දෝරු ගාමිණී බී දොඩන්වෙල මහතා විසින් වර්ෂ 2006.01.20 දින මැන සාදන ලද අංක 5888 දරන පිඹුර ප්‍රකාර ලොට් 4911 දරන ඉඩම් කොටසට මායිම් උතුරට ලොට් 2463 (පාර) නැගෙනහිරට ලොට් 62 ඩී 2 (වරිපනම් අංක 18ඒ පී. ටී. ද සිල්වා මාවත) දකුණට ලොට් 62 ඩී 3 (පාර) සහ බටහිරට පී. ටී. ද සිල්වා මාවත යන මෙකී මායිම් තුළ පිහිටි අක්කර බින්දුවයි රූඩ් බින්දුවයි පර්චස් දහයයි දශම හයයි දෙකයි පහක් (අ. 0, රූඩ් 0, පර්. 10.625) හෙක්ටයාර්ස් 0.02687) විශාල ඉඩම් කොටස මෙය බලයලත් මිනින්දෝරු ගාමිණී බී. දොඩන්වෙල මහතා විසින් වර්ෂ 2006.01.20 දින මැන සාදන ලද අංක 5888 දරන සැලැස්මකි.

ඩබ්ලිව්. නීටා පද්මිණී,
රෙජිස්ට්‍රාර්/නියෝජ්‍ය පිස්කල්,
දිසා අධිකරණය - ගල්කිස්ස.

2012 ඔක්තෝබර් මස 15 වැනි දින,
ගල්කිස්ස දිසා අධිකරණයේ දී ය.

11-190

# විවිධ දැන්වීම්

## ඩෙන්ශ්‍රී අධ්‍යාපන පදනම සංස්ථාගත කිරීම සඳහා වූ පනතකි

දිලුම් අමුණුගම වන මම, ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ පාර්ලිමේන්තුවේ ස්ථාවර නියෝගවල අංක 48 දරන ස්ථාවර නියෝගය යටතේ "ඩෙන්ශ්‍රී අධ්‍යාපන පදනම සංස්ථාගත කිරීම සඳහා වූ පනතකි" යනුවෙන් හැඳින්වෙන පනත් කෙටුම්පතක් පාර්ලිමේන්තුවේ දී ඉදිරිපත් කිරීමට අදහස් කරන බව මෙයින් දැනුම් දෙමි.

පනත් කෙටුම්පතේ අරමුණ වනුයේ පහත සඳහන් පොදු පරමාර්ථ වලින් යුක්ත වන්නා වූ එකී ඩෙන්ශ්‍රී අධ්‍යාපන පදනම සංස්ථාගත කිරීමයි.

*(අ)* මේ වන විට පෙර පාසල් අධ්‍යාපනය සඳහා අවස්ථා අහිමිව දිවි ගෙවන ග්‍රාමීය හා යුද්ධයෙන් (අවතැන්ව) පීඩාවට පත් ළමුන් ද ඉලක්ක කර ගනිමින් දිවයිනේ විවිධ ප්‍රදේශයන් හි පෙර පාසල් පිහිටුවීම වැනි ක්‍රියාකාරකම් ඇරඹීම තුළින් අධ්‍යාපනික සේවාවන් හි ගුණාත්මක බව වඩවමින් පවත්වාගෙන යාම.

*(ආ)* අඩු ආදායම්ලාභී පවුල්වල සහ විශේෂිත හැකියා ඇති ළමුන් උදෙසා අධ්‍යාපන උපකරණ පොත් පත් නිල ඇඳුම් ආදිය ද ඇතුළු අධ්‍යාපන පහසුකම් සපයා දීම.

*(ඇ)* ක්‍රීඩා සහ තොරතුරු තාක්ෂණ ක්ෂේත්‍රයන් හි නිරත පාසල් සහ අධ්‍යාපන ආයතනවලට සහයෝගය සැපයීම/සහාය ලබා දීම.

යනාදිය වේ.

දිලුම් අමුණුගම,
පාර්ලිමේන්තු මන්ත්‍රී,
මහනුවර දිස්ත්‍රික්කය.

11-194

## හෙළ ජන පදනම - සංස්ථාගත කිරීම සඳහා වූ පනතකි

තිස්ස අත්තනායක වන මම, ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ පාර්ලිමේන්තුවේ ස්ථාවර නියෝගවල අංක 48 දරන ස්ථාවර නියෝගය යටතේ "හෙළ ජන පදනම සංස්ථාගත කිරීම සඳහා වූ පනතකි" යනුවෙන් හැඳින්වෙන පනත් කෙටුම්පතක් පාර්ලිමේන්තුවේ දී ඉදිරිපත් කිරීමට අදහස් කරන බව මෙයින් දැනුම් දෙමි.

පනත් කෙටුම්පතේ අරමුණු වනුයේ පහත සඳහන් පොදු පරමාර්ථ වලින් යුක්ත වන්නා වූ එකී පදනම සංස්ථාගත කිරීමයි.

(1) මිනිසාට විඳීමට සිදුවන දුක්ඛිත තත්වයන් වලක්වාලීමේ සහන සේවා කාර්යයන් කිරීම සඳහා සාමාජික සංවිධාන ධෛර්යමත් කිරීම හා පෙළඹවීම, සහ

(2) ජාතික, ප්‍රාදේශීය හා ජාත්‍යන්තර මට්ටමේ පූර්ව මට්ටමින් වෙසෙන පෙර සූදානම් ව්‍යාපෘති නිර්මාණය කිරීම හා ඊට සහාය වීම,

යනාදිය වේ.

තිස්ස අත්තනායක,
පාර්ලිමේන්තු මන්ත්‍රී.

11-195

